| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| 11 **ශ්‍රේණිය** | **නාට්‍යය හා රංග කලාව - I** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1යි

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**01 - 40 ප්‍රශ්නවලට දී ඇති වරණ අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා සපයා ඇති පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.**

★ **පහත දැක්වෙන සිංදු කවි හා ගීත ඇසුරින් අංක 1 - 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A
බෙල්ල වට ඉසුණු ගෝමර පෙති වැටුණා
ලොල්ල වඩන පියයුරු කඳුලින් තෙමුණා
ලොල්ල ඇතිව බිසවට නපුර පැමිණුණා
කෙල්ල හඬයි හිස උකුළේ තබාගෙනා

B
අම්බරයේ සඳ සේ දිලී - රූපාවතී
නුඹ දැක්ක වෙලේ සිට සුන්දරී - ආලේ වුණී

C
සෝබමාන දේව පුරා
සදිසි සාර ලක්දිවේ
සිහලුන්ගේ නාරිඟනා
තීත කාලේ සෝබනා

D
වැඩපල කලේ තැනුවේ අඹුවක් එක්ක
හැඩ බල බලා තැලුවේ දගෙන ඔක්ක
මඩගුලි ගෙනත් පෙරළා ඉඳගෙන වක්ක
බඩහැල මලේ අරගෙන පලයන් බොක්ක

E
වත්තේ මී අඹ ගසෙහි කිරිල්ලී
මගේ පුතා නිදි පළට ඉගිල්ලී
මොනවද පවසයි ගේ ළඟ එල්ලී
තටු නොගසන් පුතු නිදිය කිරිල්ලී

01) කොහොඹා කංකාරිය ශාන්තිකර්මයට අයත් වන්නේ
1) A ය 2) B ය 3) C ය 4) D ය

02) චාර්ල්ස් සිල්වා ගුණසිංහ මහතාගේ නිර්මාණයකට අයත් වන්නේ
1) A ය 2) B ය 3) C ය 4) D ය
5)

03) "සූනියම් යාගය" ශාන්තිකර්මයට අදාළ වන්නේ
1) A ය 2) B ය 3) C ය 4) D ය

04) උඩරට ගැමි නාටකයට අයත් වන්නේ
1) A ය 2) E ය 3) B ය 4) C ය

05) නාට්‍ය වූ කලී කාර්ය අනුකරණයකැයි සඳහන් වන්නේ කාගේ ග්‍රන්ථයක ද?
1) ඇරිස්ටෝටල්ගේ ය
2) භරත මුණිගේ ය
3) ධනංජයගේ ය
4) ප්ලේටෝ ය

06) පහත වරණ අතරින් ප්‍රාසාංගික කලා පමණක් ඇති වරණය තෝරන්න.
1) චිත්‍ර කලාව, නර්තනය, මුද්‍රා නාට්‍ය සහ නාට්‍ය
2) ගීත නාටක, මුද්‍රා නාටක, බැලේ සහ මූර්ති
3) නාට්‍ය, සංගීත ප්‍රසංග, ඔපෙරා සහ නර්තන ප්‍රසංග
4) බැලේ, ඔපෙරා, චිත්‍ර කලාව සහ නාට්‍යය

07) නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) රිද්මයානුකූල අංග චලනය නෘත්ත වේ.
2) අභිනය මගින් අර්ථ ප්‍රකාශ කරන්නේ නෘත්ත වේ.
3) නෘත්‍යය හරහා අංග චලන දිස් නොවේ.
4) ශුද්ධ මාත්‍රා, ලී කෙළි, තෙල්මේ නැටුම නෘත්‍ය සඳහා නිදසුන් ය.

08) සියුම් භාව ප්‍රකාශනයට සහ නාට්‍ය ගීතයක් ගැයීමට අවශ්‍ය අභිනයන් පිළිවෙළින් දැක්වෙන්නේ
1) සාත්වික අභිනය හා ආහාර්ය අභිනය
2) වාචික අභිනය හා සාත්ත්වික අභිනය
3) ආහාර්ය අභිනය හා වාචික අභිනය
4) සාත්වික අභිනය හා වාචික අභිනය

09) නාට්‍යධර්මී හා ලෝක ධර්මී සම්ප්‍රද පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
1) ද්විත්ව රංගනය අදාල වන්නේ නාට්‍ය ධර්මී සම්ප්‍රදයටය.
2) නාට්‍යධර්මී යනු මුළුමනින්ම අපරදිගින් බිහිවූ සංකල්පයකි.
3) මනමේ, සිංහබාහු වැනි නාට්‍ය සියයට අනූවක්ම ශෛලිගතය.
4) ස්වභාවිකවූත් අව්‍යාජ වූත් විකෘති නොවූත් පාත්‍රයන් සිටින්නේ ලෝකධර්මී සම්ප්‍රදයේ ය.

10) කෙටි නාට්‍ය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) විශේෂිත වූ සංගීතයක් උපයෝගී කර ගනී.
2) වේදිකා දර්ශන හුවමාරු වීම් බොහෝ ඇත.
3) ඉතා හොඳින් වින්‍යාසගත වී තිබේ.
4) යොදා ගත යුතු චරිත ප්‍රමාණය වැඩි බවක් පෙනේ.

11) නාට්‍ය රචකයා විසින් ලියන ලද පෙළකට ජීවය ලබා දීමට මූලික වන්නේ
1) නළු නිළියෝ ය
2) අධ්‍යක්ෂ ය
3) නිෂ්පාදක ය
4) ප්‍රේක්ෂකයින් ය

12) නාට්‍ය රචනය සහ රචකයා සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
1) නාට්‍ය රචනය සඳහා පැරණි මිථ්‍යා කථා දැන සිටි යුතුම ය.
2) නාට්‍ය පිටපත පිළිබඳ මූලික අදහස රෝපණය වන්නේ රචකයා තුළය.
3) නාට්‍ය රචකයකු සතුව පරිකල්පන හැකියාවක් ඇත.
4) නාට්‍ය පෙළ හෙවත් පිටපත ද සාහිත්‍ය කෘතියකි.

13) රංගනයේ දී සුඛනම්‍ය චලන දක්වමින් ගී ගායනා කරන්නට නළුවන් ප්‍රගුණ කළ යුතු වන්නේ
1) කටහඬ අභ්‍යාස හා සංවේදන අභ්‍යාස යි.
2) ශිථිලකරණ අභ්‍යාස හා තාපන අභ්‍යාස යි.
3) සංවේදන අභ්‍යාස හා ශිථිලකරණ අභ්‍යාස යි.
4) ශිථිලකරණ අභ්‍යාස සහ කටහඬ අභ්‍යාස යි.

14) වේදිකාවේ සයික්ලෝරාමාව (පසුපස සුදු තිරය) මත "සඳක්" පෙන්වීමට වඩාත් උචිත ආලෝක පහන් වර්ගය වන්නේ,
1) තිත් පහනයි
2) අල්ට්‍රා වයලට් පහන් ය
3) ධාරාලෝක පහන් ය
4) කලර් වීල් ය

15) පසුතල නිර්මාණ සම්බන්ධයෙන් පහත ප්‍රකාශ තුළ වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
1) නාට්‍යය අධ්‍යක්ෂවරයාගේ අදහස් විමසීම නොකළ යුතුය.
2) ඕනෑම නාට්‍යයකට ගැළපෙන ලෙස පසුතලය සැකසිය යුතුය.
3) නාට්‍යයේ දර්ශනයන් භුවමාරුවට මනා සහයක් ලැබීම අවශ්‍ය නැත.
4) ප්‍රවාහනයට පහසු ලෙස සැකසීම කළ යුතුය.

16) නාට්‍යමය අවස්ථාවක් සඳහා පැහැදිලි කරගැනීමට වඩා උචිත ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ
1) ගීත ගායනය සමඟ සිදුවිය යුතුය.
2) ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලින් දක්නට ලැබේ.
3) නාට්‍යයක් තුළ නාට්‍යමය අවස්ථා පමණක් ඇත.
4) "මනමේ" නාට්‍යයේ ශෛලිය නිසා නාට්‍යමය අවස්ථා දක්නට නැත.

★ **පහත වගුව ඇසුරෙන් ප්‍රශ්න අංක 17 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| **නාට්‍යයේ නම** | **රචකයාගේ නම** | **අනුවර්තන/ පරිවර්ථනය** | **මෙරට නිෂ්පාදක** |
|---|---|---|---|
| මරාසාද් | පීටර් වයිස් | මරාසාද් | A |
| මදර් කරේජ් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | B | හෙන්රි ජයසේන |
| ඉක්නෙවුටා ඉ | C | බෙරහඬ | බන්දුල ජයවර්ධන |
| D | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |

17) ඉහත A කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තකයාගේ නම වන්නේ,
1) ජයන්ත චන්ද්‍රසිරි
2) ශ්‍රියන්ත මෙන්ඩිස්
3) සුගතපාල ද සිල්වා
4) සයිමන් නවගත්තේගම

18) ඉහත B කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තනයේ නම වන්නේ,
1) දිරිය මව සහ ඇගේ දරුවෝ
2) අපට පුතේ මගක් නැතේ
3) මනරංජන වැඩවර්ජන
4) ජනේලය

19) ඉහත C කොටුවට අයත් විය යුතු රචකයාගේ නම වන්නේ
1) එව්ගිනිෂ්වාත්ස්
2) ලුයිජි පිරැන්ඩිලෝ
3) ටෙනිසි විලියම්ස්
4) සොෆොක්ලීස්

20) ඉහත D කොටුවට අදල නාට්‍යයේ නම වන්නේ
1) මකරා
2) වලාකුළු
3) දරයිවලස්
4) කොකේසියන් චෝක් සර්කල්

21) "නානුමුරය" නමැති නාට්‍යමය අවස්ථාව ඇතුළත් ශාන්තිකර්මය වන්නේ
1) සූනියම් යාගය
2) රිද්දියාගය
3) දහඅට සන්නිය
4) මංගර මඩුව ය

22) නූතන රංග භූමිය බෙදා ඇති මනඃකල්පිත කොටස් ගණන
1) නවයකි
2) අටකි
3) දහයකි
4) දොළොසකි

23) ඓතිහාසික සිදුවීම් අලලා නිර්මාණය කරන නාට්‍ය වලදී,
1) ඓතිහාසික සිදුවීම ම නැවත ප්‍රතිනිර්මාණය කරයි.
2) එම සිදුවීම්වලට අදළව නව චරිත නර්මාණය නොකළ යුතුයි.
3) ඉතිහාසයෙන් වත්මන වෙත යහපත් දේ ගෙන ආ යුතුයි.
4) නව අර්ථකථන ඉදිරිපත් කිරීම අවම විය යුතුය.

24) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් නිර්මාණය කළ නාට්‍යකරුවා වූයේ,
1) එදිරිවීර සරච්චන්ද්‍රයන් ය
2) බන්දුල විතානගේ ය
3) ගුණසේන ගලප්පත්තිය
4) සයිමන් නවගත්තේගම ය

★ **පහත ඡායාරූප ඇසුරෙන් 25 - 28 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

25) කාමරේ පොරේ බක්මහ අකුණු, නරිබෑනා නාට්‍ය නිර්මාණය කළේ,
1) B ය 2) C ය 3) D ය 4) E ය

26) හාස්‍ය රංගනයට වඩාත් ප්‍රසිද්ධ වූයේ
1) B ය 2) C ය 3) D ය 4) A ය

27) "මූදු පුත්තු" නාට්‍යයේ "තේගිරිස්"ගේ චරිතය රඟ පෑවේ,
1) B ය 2) C ය 3) D ය 4) A ය

28) අධ්‍යාපන ක්‍රමයේ ඇති ගැටලු ගැන නාට්‍යයක් නිර්මාණය කළේ,
1) A ය 2) E ය 3) C ය 4) D ය

29) මෝරා, මහාසාර, මහසමයම ආදී නාට්‍යයන්හි රංගනයෙන් දයක වූයේ
1) නිශ්ශංක දිද්දෙණිය ය
2) එඩ්මන්ඩ් විජේසිංහ ය
3) ශ්‍රියන්ත මෙන්ඩිස් ය
4) මාක් ඇන්ටනී ප්‍රනාන්දු ය

30) "පිළිප්පු සිංඤෝ" ප්‍රසිද්ධියක් ඉසිලූයේ,
1) කෝළම් සඳහා ය
2) නූර්ති සඳහා ය
3) ශාන්තිකර්ම සඳහා ය
4) නාඩගම් සඳහා ය

★ **පහත වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 31 - 32 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**


A


B

31) A සහ B වෙස් මුහුණු පිළිබඳ අසත්‍යය ප්‍රකාශය වන්නේ
1) A සන්නි මුහුණක් සහ B කෝළම් මුහුණකි.
2) B සන්නි මුහුණක් සහ A කෝළම් මුහුණකි.
3) A සහ B දෙකම කෝළම් මුහුණු වේ.
4) A සහ B දෙකම සන්නි මුහුණු වේ.

32) මෙම වෙස් මුහුණු භාවිතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) තත්කාලීන සමාජයේ නිතර මේ අංග දක්නට ඇත.
2) විනෝදය උදෙසා පමණක්ම උපයෝගී විය.
3) ලෙඩ රෝග දුරලීම සඳහා ම යොදා ගෙන ඇත.
4) තත්කාලීන සමාජ හරස්කඩක් පෙන්වන්නටත් යොදා ගැනින.

33) 1956 දී ලාංකීය නාට්‍ය කලාවේ හැරවුම් ලක්ෂ්‍යක් වූ "මනමේ" නාට්‍ය නිෂ්පාදනය කළේ,
1) හෙන්රි ජයසේනයන්ය
2) එදිරිවීර සරච්චන්ද්‍රයන්ය
3) සුමින්ද සිරිසේනයන් ය
4) පරාක්‍රම නිරිඇල්ලයන් ය

34) වී. ක්‍රිස්තියන් පෙරේරා මහතා නිර්මාණය කළ නාට්‍ය පමණක් ඇති වරණය කුමක්ද?
1) ඉයුජින්, දඹදෙණි කතාව
2) සිංහවල්ලි, හාන්ත ජෝසප්
3) බ්‍රම්පෝඩ්, බැලසන්ත
4) සෙලෙස්තිනා, ලියනෝරා

35) නූර්ති රචකයෙක් නොවන්නේ,
1) තෝමස් සිල්වා ය
2) චාල්ස් ඩයස් ය
3) ජෝන් ද සිල්වා ය
4) සී දොන් බස්තියන් ය

36) වේදිකා නාට්‍යයක වේෂ භූෂණය සැලසුම් කිරීමේදී
1) ප්‍රේක්ෂක ආකර්ශනය දිනාගත යුතුය.
2) ලෝක ධර්මී නාට්‍ය සඳහා පමණක් යොදා ගනී.
3) පසුතලයේ වර්ණ පිළිබඳ අවබෝධය තිබීම වැදගත්ය.
4) චරිතයන්ට වඩා නළුවා මතුවන ලෙස නිර්මාණය කළ යුතුය.

37) සේරමාන් රජු මානෙල් මලක් කඩා සිඹිද්දී ඒ තුළ සිටි මැඩියෙකු නාසයට ඇදී ගොස් මොළයට යාමෙන් හිසරුදා ඇති වූ උපත් කතා පුවත ඇති ශාන්තිකර්මය වන්නේ
1) කොහොඹා කංකාරිය
2) රිද්දි යාගය
3) සූනියම් ශාන්තිය
4) දෙවොල් මඩුව

38) රූපණයේ දී නළු නිළියන්
1) පරිකල්පන ශක්තිය උපයෝගී කරගත යුතු නොවේ.
2) අත්දැකීම් තුළින් පමණක් රංගනය කළ යුතු වේ.
3) රංගනය කරන චරිතයේ බාහිර පෙනුම ගැන සිතිය යුතු වේ.
4) අභ්‍යන්තර ප්‍රකාශනය පමණක් සිතීම ප්‍රමාණවත් ය.

39) කෝළම් රංගනයකදී මුලින්ම සබයට පැමිණෙන්නේ
1) රජු සහ බිසවය
2) තොරතුරු කතාකාරයා ය
3) ආරච්චිය
4) අණබෙරකරුය

40) පහත වරණ අතරින් නොගැළපෙන පදය සහිත වරණය තෝරන්න.
1) සොකරි, සෙල්ලන් ළමා, වෙද
2) තානායම්පොළ, ආරච්චි, වෙස් අත්ත
3) කරළිය, බහුබූතයා, හඬදූතයා
4) රොලීනා, ටවර්හෝල්, රාමායණය